# ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාලවල මුද්‍රිත තොරතුරු මූලාශ්‍ර ප්‍රතිග්‍රහණය : ග්‍රන්ථ ප්‍රතිග්‍රහණය පිළිබඳ අධ්‍යයනයකි.

(කොළඹ,කුරුණෑගල හා හම්බන්තොට දිස්ත්‍රික්ක ඇසුරින් )

FACULTY OF GRADUATE STUDIES
RECEIVED
10 SEP 2013
UNIVERSITY OF KELANIYA

එස්.සි.පී. සමරතුංග
(FGS/L/2001/503/R)

| | |
|---|---|
| ප්‍රවේශ අංකය: | 845 |
| වර්ග අංකය: | |

කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජිය විද්‍යා පිඨයේ පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ සමාජිය විද්‍යාපති පර්යේෂණ උපාධිය සඳහා ඉදිරිපත් කරන ලදි.

2013

# සාරාංශය


ශ්‍රී ලංකාවේ පුස්තකාල පද්ධතිය නියෝජනය කරන විශාලතම ඒකකය මහජන පුස්තකාල වේ. පළාත් පාලන ආයතන විසින් මහජනතාවගේ සුභ සාධනය සඳහා පවත්වා ගෙන යනු ලබන විවිධාකාර වූ සේවාවන් අතර, එක් සේවාවක් ලෙස සැලකිය යුතු දුරකට රට පුරා ව්‍යාප්තව පවතී.

වර්තමායේ තාක්ෂණයේ දියුණුවත්, තොරතුරු තාක්ෂණයේ වර්ධනයත් නිසා තොරතුරු ප්‍රමාණාත්මකව ඉහළ ගොස් ඇති අතර, ඒවායේ අවශ්‍යතාවයද ශීඝ්‍රයෙන් ඉහළ යමින් පවතී. මෙම අභියෝගයට මහජන පුස්තකාල ද මුහුණ දී ඇත. පාඨකයින්ගේ තොරතුරු අවශ්‍යතාවලට පිළිතුරු සැපයීම සඳහා කළ යුතු ප්‍රධානම කාර්යය වන්නේ එම තොරතුරු ඇතුළත් ද්‍රව්‍ය අත්පත් කර ගැනීමයි.

විවිධාකාර වූ තොරතුරු මූලාශ්‍ර බිහිවුවත්, තවමත් ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාලවල ප්‍රධානතම තොරතුරු මූලාශ්‍රය වන්නේ මුද්‍රිත පොත්ය. විවධ වූ පාඨක අවශ්‍යතාවන් හා ගැටෙමින් පොත්පත් අත්පත් කර ගැනීම මහජන පුස්තකාල වලට පැවරී ඇති භාරදූර වූ ද, සංකීර්ණ වූ ද වගකීමකි. එනිසා මහජන පුස්තකාල වල ප්‍රධාන තොරතුරු මූලාශ්‍රය වන මුද්‍රිත ග්‍රන්ථ ප්‍රතිග්‍රහණය පිළිබඳව විමසා බැලීම කාලීන අවශ්‍යතාවයක් බවට පත්වී ඇත. ඒ අනුව ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාලවල වර්තමාන ග්‍රන්ථ ප්‍රතිග්‍රහණයේ ස්වභාවය සොයා බැලීම, පොත්පත් ප්‍රතිග්‍රහණය සම්බන්ධයෙන් ක්‍රමවේදයක් තිබේදැයි විමසා බැලීම, ප්‍රතිග්‍රහණයේදි ඇතිවන බාධක සොයා බැලීම සහ ඉදිරියේදි ප්‍රතිග්‍රහණ ක්‍රියාවලිය සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ යෝජනාවලියක් ඉදිරිපත් කිරීම අරමුණු කරගෙන මෙම නිබන්ධය සම්පාදනය කරන ලදි.

අධ්‍යයනයේ නියැදිය ලෙස එක් දිස්ත්‍රික්කයකින් පුස්තකාල 06 බැගින් තෝරා ගන්නා ලදි. මෙම පුස්තකාල 06 ඒවා පාලනය කරනු ලබන මහා නගර සභා, නගර සභා සහ ප්‍රාදේශය සභා යන ආයතන වර්ග 03 ම නියෝජනය වන පරිදි තෝරා ගෙන ඇත.

තෝරා ගත් පුස්තකාලවල පුස්තකාලයාධිපතිවරුන්ට සහ පුස්තකාල භාරව සේවය කරන පුස්තකාල සහායක වරුන්ට ව්‍යුහගත ප්‍රශ්නාවලියක් ඉදිරිපත් කිරීමෙන් හා අතුරු ප්‍රශ්න ඔස්සේ ඔවුන් සමග සාකච්ඡා කිරීමෙන්ද දත්ත රැස් කරගන්නා ලදි.

එසේ ලබාගත් දත්ත විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව එම පුස්තකාල පොත් ප්‍රතිග්‍රහණය කිරීම සම්බන්ධයෙන් කිසිම ක්‍රමවේදයක් නොමැති බවත්, මූල්‍ය ප්‍රතිපාදන වල හිඟකම නිසා දැඩි

අර්බුදයකට මුහුණ පා සිටින බවත් පැහැදිලි විය. ඊට අමතරව කාර්ය මණ්ඩල හිඟකම,ඉඩකඩ ප්‍රශ්න, නඩත්තු දුෂ්කරතා, අපහරණ ප්‍රශ්න ආදි වශයෙන් ග්‍රන්ථ ප්‍රතිග්‍රහණයට අදාලව ගැටලු රාශියක් පවතින බව ලබාගත් දත්ත මගින් අනාවරනය විය.

මෙසේ හඳුනා ගන්නා ලද ගැටලු වලට යම් තරමකට හෝ විසඳුමක් වශයෙන් පොත් ප්‍රතිග්‍රහණයේදි අදාළ කර ගත යුතු කරුණු කිහිපයක් යෝජනා ලෙස ඉදිරිපත් කර ඇති අතර, ඉදිරියේදි ග්‍රන්ථ ප්‍රතිග්‍රහණය ක්‍රියාවලිය කෙසේ සිදුවිය යුතු දැයි අදහස් කිහිපයක්ද අන්තර්ගත කර ඇත.

**මූලික පද :** මහජන පුස්තකාල, ග්‍රන්ථ ප්‍රතිග්‍රහණය, මුද්‍රිත තොරතුරු මූලාශ්‍ර, ශ්‍රී ලංකාවේ පුස්තකාල